# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 8

පසු කලාපයට මා ලියූ ලිපියෙන් පැහැදිලි කරන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ 'විමුක්ති ගී' ප්‍රසිද්ධ ප්‍රසංගයක් වශයෙන් රටේ ජනතාව වෙත ඉදිරිපත් කරන්නට පෙර පැවතුන පසුබිම ගැනයි. මෙම ලිපියෙන් මා අදහස් කරන්නේ 1977 න් පසු කාලීන වකවානුවේ දී 'විමුක්ති ගී' ප්‍රසංගය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරන විට එම ප්‍රසංගය හා සම්බන්ධ ඇතැම් සිද්ධීන් හා පුද්ගලයින් ආශ්‍රයෙන් රෝහිත මුණසිංහ සහෝදරයා විසින් පල කොට තිබෙන ඇතැම් විකෘති කිරීම් සහ වැරදි සහගත කරුණු පිළිබඳව මා දන්නා සැබෑ තත්වය පැහැදිලි කිරීමට යි.

රෝහිත මුණසිංහ සහෝදරයා පල කොට තිබෙන කරුණු දෙස බලන කෙනෙකුට වැටහෙන්නේ සුනිලා අබේසේකර සහෝදරිය 'විමුක්ති ගී' ප්‍රසංගයට ඕපපාතික ලෙස සම්බන්ධ වූ බවක් ය. මේ නිසා ඒ සහෝදරිය ජනතා විමුක්ති පෙරමුණ ට සම්බන්ධ වී සිටි අයුරු කෙටියෙන් හෝ පැහැදිලි කිරීම වැදගත් වේ යයි මම කල්පනා කරමි. 1971 සිට බන්ධනාගාර ගත කර සිටි සියළු දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස බල කෙරුන ප්‍රබල ව්‍යාපාරය ගොඩ නැගෙන්නට පටන් ගත්තේ 1975 කාලයේ සිටය. එම ව්‍යාපාරයට බොහෝ ජාතික සහ ජාත්‍යන්තර මානව සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන මැදිහත් වී තිබුනි.

සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය (Civil Rights Movement) විසින් 1972 කාලයේ සිටම මානව සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් සහ අපරාධ යුක්ති කොමිෂන් සභාවට එරෙහිව ව්‍යාපාරයක් දියත් කොට තිබුනා පමණක් නොව රජය විසින් එම කොමිෂන් සභා පණත යටතේ පවරා තිබුනු 'මහ නඩුවේ' ඇතැම් චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා රාජ නීතිඥ එස් නඩේසන් මහතාත් නීතීඥ සූරියා වික්‍රමසිංහ මෙනෙවියත් පත් කොට තිබුණි. ඒ වකවානුවේදී ම ලංකා වෙළඳ සේවක සංගමය (Ceylon Mercantile Union) විසින් මෙම අරමුණු වෙනුවෙන් කටයුතු කරමින් සිටි අතර 'මහ නඩුවේ' ජනතා විමුක්ති පෙරමුණට එවකට පක්ෂපාතීව සිටි චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා මුල් කාලයේ අධිනීතීඥ බාලා තම්පෝ සහ නීතීඥ ආර් සරවනභගවාන් යන සහෝදරවරුන් ද පසු කාලයේ දී අධිනීතීඥ බාලා තම්පෝ, නීතීඥ පී රාජනායගම් සහ නීතීඥ එච් ඒ සෙනෙවිරත්න යන සහෝදරවරුන් ද පත් කොට තිබුණි. මෙහිදී අපරාධ යුක්ති කොමිෂන් සභාව හමුවේ කෙටි කලකට පෙනී සිටි අධිනීතීඥ ප්‍රින්ස් ගුණසේකර සහ නීතීඥ එඩ්මන්ඩ් සමරක්කොඩි සහෝදරවරුන් ද, අපරාධ යුක්ති කොමිෂන් සභා පණත යටතේ බන්ධනාගාර ගත කිරීමෙන් පසු සෑම සති කිහිපයකට වරක් රෝහණ විජේවීර සහෝදරයා සහ මා බැලීමට නොවරදවා බන්ධනාගාරයට පැමිණි නීතීඥ එම් බී රත්නායක සහෝදරයා ද මගේ කෘතඥ පූර්වක මතකයට නැගේ.

1971 අප්‍රේල් නැගිටීම සම්බන්ධයෙන් සිර කඳවුරුවල රඳවා තබා ගෙන සිටි ඇතැම් අය බලන්නට යාමටත්, ඒ අය ගේ පවුල් වල අය දැක බලා ගෙන ඒමට ඔවුන් ගේ නිවෙස් වලට යාමටත්, එම පවුල්වල අයට උදව් උපකාර කිරීමටත්, රඳවා තබා ගෙන සිටි අය බලන්නට සිර ගෙවල් වලට පැමිණෙන ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ට නවාතැන් සහ මුදල් ආධාර ලබා දීමටත් සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය විසින් ද, ලංකා වෙළඳ සේවක සංගමය විසින් ද මේ කාලයේ කටයුතු කරමින් තිබිණි. සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය විසින් සංවිධානය කර තිබුනු මෙවැනි කටයුතු වලට සුනිලා අබේසේකර සහෝදරිය ද රංජිත් පෙරේරා සහෝදරයා ද සම්බන්ධ වී කැප වීමෙන් වැඩ කටයුතු කරමින් සිටියහ.

1973 දී පමණ සුනිලා සහෝදරිය වරක් අප බැලීම සඳහා නීතීඥ එච් ඒ සෙනෙවිරත්න සහෝදරයා මගින් අපරාධ යුක්ති කොමිෂන් සභාවට ද පැමිණියා ය. 1976 කාලයේ සිටම මධ්‍යම පාන්තික කොටස් සහ සිංහල නොවන ජන කොටස් ජනතා විමුක්ති පෙරමුණ වෙත දිනා ගැනීමට මහත් උත්සාහයක් දරන ලදි. මෙම උත්සාහයටලංකා ගුරු සංගමය වැනි සංවිධාන ද සුනිලා අබේසේකර සහෝදරිය වැනි අයද මහත් ලෙස දායක වූහ.

පැවති රජයට සම්බන්ධ ව සිටි සහ නොසිටි බොහෝ බුද්ධිමතුන් ද, පැවිදි පක්ෂය සහ මධ්‍යම පාන්තික කොටස් ද, රටේ ඇතැම් වැඩ කරන ජනතා කොටස් ද, ඒ වන විට රහසිගතව (ආවෘත ලෙස) දේශපාලන කටයුතු වල නිරතව සිටි ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර සහෝදරියන් ද දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය ට එකතු වී සිටියහ. බන්ධනාගාරවලින් නිදහස ලබා එළියට පැමිණි බොහෝ සහෝදර සහෝදරියන් ද මෙම ව්‍යාපාරය ට සම්බන්ධ වූහ. 1976 දී පමණ මැගසින් බන්ධනාගාරයෙන් නිදහස ලැබූ රත්මලානේ දුම්රිය කම්කරු සමිතියේ අල්විස් සහෝදරයා උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

රජය විසින් 1976 දී හදිසි නීතිය ඉවත් කර ගන්නා ලදී. ඊට පෙර බන්ධනාගාරයෙන් නිදහස් වී යලි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයේ නිරත ව සිටි කෙලී සේනානායක සහෝදරයා ද, 1975 දී පමණ බන්ධනාගාරයෙන් පැන ගොස් යලි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයේ නිරත ව සිටි උපතිස්ස ගමනායක සහ නන්දන මාරසිංහ වැනි සහෝදරවරුන් ද මෙම ව්‍යාපාරය සමග



සුනිලා අබේසේකර සහෝදරිය

ඉතා සමීප ලෙස කටයුතු කල අය වූහ. ජනතා විමුක්ති පෙරමුණ යලි සංවිධානය කරන මෙම කාලයේ දී සුනිලා සහෝදරිය ද මෙම දුෂ්කර කටයුත්තට උර දුන් අය අතර විය.

අපරාධ යුක්ති කොමිෂන් සභා පණත අහෝසි කොට 1977 නොවැම්බර් මස දෙවැනි ද මැගසින් බන්ධනාගාරයෙන් මාද ඇතුළුව ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය නිදහස් කර ලන්නට පෙර දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස බල කර සිටි දුම්රිය කම්කරු වැඩ වර්ජනය සංවිධානය කරන ලද්දේ අල්විස් සහෝදරයා ගේ මැදිහත් වීමෙනි. මෙම දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය ආරම්භ කරන ලද අවධියේ දී ඊට සම්බන්ධ වුනු අය අතර සුනිලා අබේසේකර සහෝදරිය ද විය.

1977 නොවැම්බර් මස දෙවැනි දයින් පසු රෝහණ විජේවීර සහෝදරයා පළමු වරට සුනිලා සහෝදරිය මුණ ගැසෙන්නේ මෑතකදී අභාවයට පත් වූ නීතීඥ එම් බී රත්නායක සහෝදරයාගේ නාරාහේන්පිට නිවසේ දී ය. ඉන් පසු කාලයේ දී නන්දසීලි සහ කරුණා යන සහෝදරියන් සමඟ සමාජවාදී කාන්තා පෙරමුණේ දේශපාලන කටයුතු වලද නිරත වන ලෙස සුනිලා සහෝදරියට පක්ෂයෙන් උපදෙස් දෙන ලදී. 1978 මාර්තු මස ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කරන ලද, උපතිස්ස ගමණායක සහෝදරයා මූලාසනය හෙබ වූ රැස්වීම අමතා සුනිලා අබේසේකර සහෝදරිය ද කථා කලාය.

1977 නොවැම්බර් මස හත්වැනි ද කොළඹ නගර ශාලා භූමියේ පවත්වන ලද දැවැන්ත රැලියෙන් ආරම්භ කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ව්‍යාපාරයේ තවත් පැත්තක් වූයේ ගෙන් ගෙට ගොස් කරන ලද දේශපාලන සාකච්ඡා සහ හමුවීම් වටය යි. මේ වන විට කෙලී සේනානායක සහෝදරයා ගේ මෙහෙයවීම යටතේ 'නියමුවා' පුවත් පත පක්ෂයේ මධ්‍යම පුවත් පත ලෙස ස්ථාපිත කොට තිබිණි.

එහෙත් ජාත්‍යන්තර තලයේ මෙන්ම බුද්ධිමතුන් සහ මධ්‍යම පාන්තික කොටස් අතර ද දේශපාලන කටයුතු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන පුවත් පතකු ත්, දෙමළ සහ මුස්ලිම් ජන කොටස් අතර දේශපාලන කටයුතු කිරීම සඳහා දෙමළ භාෂාවෙන් පළ කරන පුවත් පතකු ත් ආරම්භ කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පැන නැග තිබුනි.

ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් පළ කරන පුවත් පත් වල නම වශයෙන් 'රතු බලය' යොදා ගැනීමට එම පත්‍රවල කතෘ වශයෙන් මා කල යෝජනාව දේශපාලන මණ්ඩලය විසින් පිළි ගන්නා ලදී. ඒ අනුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන පුවත් පත රෙඩ් පවර් (Red Power) යනුවෙන් ද, දෙමළ භාෂාවෙන් පළ කරන පුවත් පත සෙන් ශක්ති (බවුත රතෙවී) යනුවෙන් ද නම් කොට එම පත්‍ර පළ කිරීම සඳහා අවශ්‍ය දක්ෂතා සහිත වූද, මගේ මඟ පෙන්වීම අනුව සාමූහික ව වැඩ කල හැකි වූද කණ්ඩායම් දෙකක් සකස් කර ගන්නා ලදී. රෙඩ් පවර් පත්‍රයේ ලිපි ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කල කණ්ඩායමේ දෙදෙනෙක් සිටියහ. ඒ සුනිලා අබේසේකර සහෝදරිය ත්, රංජිත් පෙරේරා සහෝදරයා ත් ය. මට මතක අන්දමට ජනතා විමුක්ති පෙරමුණ ප්‍රථම වතාවට තරඟ කල කොළඹ මහ නගර සභා මැතිවරණය පැවැත් වූ කාලය වන විට මෙම පුවත් පත් දෙකම ස්ථාපිත කොට තිබිණි. එම මහ නගර සභා මැතිවරණයේ දී සහ ඉන් පසු කාලයේ දී නැගෙනහිර කොළඹ සහ බටහිර කොළඹ දක්වා වූ ප්‍රදේශය තුල ගෙන් ගෙට යෑමේත්, පක්ෂයේ ප්‍රකාශණ අලෙවි කිරීමේත්, පක්ෂයට අරමුදල් එකතු කිරීමේත් ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් මෙහෙයවන ලද්දේ සුනිලා අබේසේකර සහෝදරිය ත්, රංජිත් පෙරේරා සහෝදරයා ත් ඇතුළු කණ්ඩායමක් විසිනි.

'විමුක්ති ගී' ප්‍රසංගය හා සම්බන්ධ ඇතැම් සිද්ධීන් ගැන රෝහිත මුණසිංහ සහෝදරයා විසින් පල කොට තිබෙන විකෘති කිරීම් සහ වැරදි සහගත කරුණු පිළිබඳව ලියන්නට පෙර තවත් ප්‍රධාන කරුණක් පැහැදිලි කල යුතු ව ඇත.

මේ කාලය තුල දීම ජනතා විමුක්ති පෙරමුණ විසින් ගන්නා ලද තවත් තීරණයක් නම් 'මානව අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානය' ක් (Human Rights Organisation) ගොඩ නඟා ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් පුරාම එහි ශාඛාවක් පිහිටුවීම ට කටයුතු කිරීමයි. 1978 අග දී පමණ අපි 'මානව අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානය' ගොඩ නඟා දිස්ත්‍රික් ශාඛා පිහිටුවීම ද ආරම්භ කෙලෙමු. එහෙත් මෙම වැඩ පිළිවෙල දිගට කර ගෙන යෑමට හැකියාවක් අපට තිබුනේ නැත. 'මානව අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානයේ' ආරම්භක සාමාජික සාමාජිකාවන් අතර එහි සභාපති ධූරය හෙබ වූ නීතිඥ උභය වීරසිංහ, රෙජී සිරිවර්ධන සහ වෛද්‍ය අතුල සුමතිපාල යන සහෝදර වරුන් ද, මා ද, සුනිලා අබේසේකර සහෝදරිය ද චිත්‍රා මුදලිගේ කන්‍යා සහෝදරිය ද වූහ.

ඉහත දැක්වූ කරුණු වල පරමාර්ථය වූයේ රෝහිත සහෝදරයා විසින් වැරදි සහගත ලෙස පල කොට තිබෙන අන්දමට සුනිලා අබේසේකර සහෝදරිය 'විමුක්ති ගී' ප්‍රසංගයට උඩින් පාත් වූ කෙනෙකු නොවූ බව පෙන්වා දීම සඳහා ය.

මීළඟ ලිපියෙන් සුනිලා අබේසේකර සහෝදරිය 'විමුක්ති ගී' ප්‍රසංගය හා සම්බන්ධයෙන් ඉටු කල වැඩ කොටස සහ එම සහෝදරිය පක්ෂවෙන් ඉවත් කිරීමට ගන්නා ලද තීරණය ගැන කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙමි.

ලයනල් බෝපගේ

## ලෝක වනාන්තර දිනය - මාර්තු 21

ඔබ දන්නවාද?

- ලෝකයේ මුළු භූමි ප්‍රමාණයෙන් 30% පමණ වනාන්තර වලින් සමන්විතයි.එනම් හෙක්ටෙයාර බිලියන 3.9 ක පමණ ප්‍රමාණයක්
- ලොව වනාන්තර වලින් 47% පවතින්නේ උෂ්ණ කලාපීය රටවල.33 % ක් උත්තර ධ්‍රැවාසන්න පෙදෙස් වලත් 11 % ක් සෞම්‍ය කලාපික ප්‍රදේශවලත් 9 % ක් උප නිවර්තන කලාපවලත් පිහිටා තිබෙනවා.
- ලොව රටවල් 10 කයි මුළු වනාන්තර වලින් 2/3 ක්ම පිහිටා ඇත්තේ.ප්‍රමාණයේ පිළිවෙලින් එම රටවල් වන්නේ රුසියාව, බ්‍රසීලය, කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඕස්ට්‍රේලියාව,කොංගෝව, ඉන්දුනීසියාව, ඇන්ගෝලාව හා පේරු රාජ්‍යය.
- වැසි වනාන්තර ලොව ජීවී විශේෂ වලින් 60% කට පමණ වාසස්ථාන සපයනවා.මේ අතරින් ඇමසන් වනාන්තරය ලොව ඉහලම ජෛව විවිධත්වය ඇති ස්ථානය ලෙසයි සැලකෙන්නේ.ගොඩබිම වෙසෙන ජීවී විශේෂ වලින් 1/4 ක් පමණ මෙහි දැකිය හැකියි.
- වනාන්තරහරණය ඉහළම මට්ටමකින් සිදුවන්නේ දකුණු ඇමරිකාවේ.එය අවුරුද්දකට හෙක්ටෙයාර් මිලියන 4.3 ක්. කෙසේ වෙතත් වනාන්තරහරණයේ ඉහළම ප්‍රතිශතයක් හිමිකර ගන්නේ දකුණු ආසියාතික රටවල්.
- වනාන්තර විනාශ කිරීමෙන් අවුරුද්දකට කාබන් ටොන් බිලියන 1.7 පමණ වායුගෝලයට නිකුත් වෙනවා.මෙය මුළු ලෝක කාබන් විමෝචන ප්‍රමාණයෙන් 20% ක්. සෑම තත්පර 4 කට වරක්ම පාපන්දු ක්‍රීඩා පිටියක තරම් ප්‍රමාණයක වැසි වනාන්තර ලොවට අහිමි වෙනවා.
- ලෝකයේ දේශගුණික තත්වයන් වෙනස් වීමට වනාන්තරහරණය සෘජුවම බලපානවා. වනාන්තර පරිසර පද්ධති තුළ ගොඩබිම මුළු කාබන් ප්‍රමාණයෙන් හරි අඩකටත් වඩා අඩංගුයි.වායුගෝලයත් අනෙකුත් ගොඩබිම පරිසර පද්ධතීනුත් අතර කාබන් හුවමාරුව සැලකුවහොත් ඉන් 80% ක් පමණ සිදු කරන්නේ වනාන්තර. වැසි වනාන්තර හෙක්ටෙයාරයකට

අවුරුද්දකට කඩ2 ටොන් 1 ක ප්‍රමාණයක් වායුගෝලයෙන් උරාගත හැකියි.

- වනාන්තරහරණයට මූලිකවම බලපාන්නේ කෘෂිකාර්මික කටයුතු සහ පශු ගොවිපල ආදිය සඳහා වනාන්තර හෙලි පෙහෙලි කිරීම, නාගරික හා යටිතල පහසුකම් ඇතිකිරීමට සිදුකරන හෙලි පෙහෙලි කිරීම මෙන්ම දැව හා දර ලබා ගැනීම සඳහා ගස් කැපීම හා පතල් කැණීම් ආදියයි.
- ලොව වනාන්තර සංරක්ෂණය සඳහා ඔබටත් දායක විය හැකියි.ඒ කොහොමද?

1. පරිසර සංරක්ෂණයේ හා වනාන්තර සංරක්ෂණයේ වැදගත්කම අනෙක් අයට කියාදීමෙන්
2. වනාන්තර හෙලි පෙහෙලි කිරීමෙන් විනාශ වූ පරිසර පද්ධති ඇති ස්ථාන වල නැවත ගස් සිටවීමෙන්
3. පරිසර හිතකාමීව ජිවත් වීමේ වැදගත්කම අනෙක් අයට කියාදීමෙන්
4. කරදාසි වැනි දෑ හැකි තරම් අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමෙන් හා පුවත්පත් වැනි දෑ ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන්
5. නිවාස ආදිය සෑදීමට දැව යොදාගැනීමේදී හැකිතාක් දුරට තර්ජනයට ලක්වූ ගස් වලින් ලබාගන්නා දැව භාවිතය අවම කිරීමෙන්

**අපි අපට හැකි පමණින් වනාන්තර සංරක්ෂණයට දායක වෙමු. හෙට පරපුරට නිරුදක කතරක් නොව හරිත ලෝකයක් උරුම කරමු.**